සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade	11 ශ්‍රේණිය	කාලය நேரம் Time: පැය 03යි.

බුද්ධ ධර්මය - I

නම பெயர் Name: .....

විභාග අංකය சுட்டிலக்கம் Index No.: .....

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. සිදුහත් කුමරුගේ නම් තැබීමේ උළෙලට සහභාගි වූ බමුණු පූජකවරු සංඛ්‍යාව වනුයේ,
   (1) 102 (2) 118 (3) 108 (4) 128

2. තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය,
   (1) අකාලික වේ. (2) සංදිට්ඨික වේ. (3) ඕපනයික වේ. (4) ස්වාක්ඛාත වේ.

3. බුදුරජාණන් වහන්සේට වේරංජාවේදී "යව" නැමති කටුක ආහාරය වළඳමින් කල් ගෙවීමට සිදුවූයේ,
   (1) දහවන වස් කාලයේ දී (2) දොළොස්වන වස් කාලයේ දී
   (3) පසළොස්වන වස් කාලයේ දී (4) විසි එක්වන වස් කාලයේදී

4. අරහන්ත බුද්ධ, පච්චේක බුද්ධ, සම්මා සම්බුද්ධ යන තුන් ආකාරයට සත්‍ය අවබෝධ කරන බව ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය නම්,
   (1) ත්‍රිවිධ රත්නය නම් වේ. (2) ත්‍රි ශික්ෂා නම් වේ.
   (3) තිපරිවට්ටය නම් වේ. (4) තුන්තරා බෝධිය නම් වේ.

5. ධම්මපදය පිළිබඳ දක්වා ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   (1) ධම්මපදයෙහි වග්ග 28ක් ඇතුළත් ය.
   (2) ධම්මපදය තාලානුකූලව සජ්ඣායනා කළ හැකිය.
   (3) ධම්ම පදයෙන් ලබා දෙන ජීවිතාදර්ශ කාලත්‍රයට ම ගත හැකිය.
   (4) ධම්මපදයෙහි අඩංගු ගාථා තුළ අර්ථ රසය හා ශබ්ද රසය ඇත.

6. බුදුන් වහන්සේ, චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත කොට පස්වග භික්ෂූන් වහන්සේලා අමතා දේශනා කළේ,
   (1) අනන්ත ලක්ඛණ සූත්‍රය (2) දම්සක් පැවතුම් සූත්‍රය
   (3) පරාභව සූත්‍රය (4) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය

Past Papers Wiki

7. සිත් පිත් නොමැති වෘක්ෂයක් දෙස සතියක් ඇසිපිය නොහෙලා බලා සිටීමෙන් බුදුරදුන් ලෝකයාට පෙන්නුම් කළේ,
   (1) වෘක්ෂයක ඇති මූල්‍යමය වටිනාකම (2) දෙනෙතෙහි ඇති ශක්ති සම්පන්න බව
   (3) ගස හා මිනිසා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය (4) කළගුණ සැලකීමේ උදාරතර ආදර්ශය

8. "වැරදි කරන්නා සදාකාලිකව ම වරදකරුවෙකු නොකොට ඔහු යහපත් පුද්ගලයකු කළ හැකිය" එම ආකල්පය ගොඩනැගීම තුළින් බුදුන් වහන්සේ සමාජ ශෝධනය සඳහා කටයුතු කළ සේක. ඒ සඳහා නිදසුනකි,
   (1) සුනීත පිළිබඳ කතා පුවත (2) සෝපාක පිළිබඳ කතා පුවත
   (3) අංගුලිමාල කතා පුවත (4) ආලවක කතා පුවත

9. අභියෝග හමුවේ බියෙන් පලා ගොස් කටයුතු කරන්නාගේ මෙලොව පරලොව ජීවිතය,
   (1) සාර්ථක වේ. (2) අසාර්ථක වේ. (3) මධ්‍යස්ථ වේ. (4) සම්පූර්ණ වේ.

10. තණ්හා මාන හා වැරදි දෘෂ්ටියෙන් තොරව උපාය කුසලතා ආදියෙන් යුක්තව සිදුකරන දානාදී පුණ්‍ය කර්ම හඳුන්වන්නේ,
   (1) පාරමිතා ලෙස ය. (2) රාජධර්ම ලෙස ය.
   (3) ලෝකය හා ධර්මය ලෙස ය. (4) අත්තූපනායික ධර්ම ලෙස ය.

11. සසර සැරිසරන සත්වයන්ට මුහුණ දීමට සිදුවන කායික හා මානසික රෝගාබාධ වැළඳීමේ දුක යනු,
   (1) ජාති දුක (2) ජරා දුක (3) ව්‍යාධි දුක (4) මරණ දුක

12. පින්කිරියවතකි, ආර්ය ධනයකි, රාජ ධර්මයකි, පාරමිතාවකි, ගිහි පැවිදි සැමට සැපයකි, සියලු සුවඳ ඉක්මවා යන සුවඳකි. යනාදී ලක්ෂණ සියල්ල ඇත්තේ,
   (1) දානයට (2) වීර්යයට (3) සීලයට (4) ප්‍රඥාවට

13. කුසල කර්මයන්හි අප්‍රමාද වීම,
   (1) අකුසලයන්ගෙන් ඇත්වීමකි. (2) දස රාජ ධර්මයකි.
   (3) පුද්ගල පිරිහීමට හේතුවන කරුණකි. (4) පුද්ගල දියුණුවට හේතුවන කරුණකි.

14. "අනවජ්ජානි කම්මානි" යනුවෙන් මංගල සූත්‍රයෙහි දැක්වෙන්නේ,
   (1) නිවැරදි කර්මාන්ත කිරීම ය. (2) කුසල් දහම් කිරීමයි.
   (3) අකුසලයන්ගෙන් ඇත් වීමයි. (4) ධර්මයෙන් සංග්‍රහ කිරීමයි.

15. සැප සම්පතින් යුතු යහපත් කාලයක උපත ලද පුද්ගලයාට වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැල සී, පාප කර්මවල විපාක නොලැබී යයි. බෞද්ධ කර්ම සංකල්පයෙහි මෙය හැඳින්වෙන්නේ,
   (1) උපධි සම්පත්තිය නමිනි. (2) කාල සම්පත්තිය නමිනි.
   (3) පයෝග සම්පත්තිය නමිනි. (4) ගති සම්පත්තිය නමිනි.

16. "පස්කම් සුව විඳිමින් රන් රිදී, කහවණු පරිහරණය කරමින් ජීවත්වන අපට මෙලොව, පරලොව හිත සුව පිණිස පවතින ධර්මයක් දේශනා කරන්නැයි" බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ,
   (1) එක්තරා දෙවි කෙනෙකි. (2) කාලාම වැසියන්
   (3) දීඝජානු කෝලිය පුත්‍රයා (4) දීඝායු කුමාරයා

17. ඇතිවීම, පැවතීම, නැතිවීම, වශයෙන් පවත්නා ලෝකය හේතු ප්‍රත්‍ය වශයෙන් එකිනෙකට සාපේක්ෂව පවත්නා ආකාරය පැහැදිලි වන්නේ,
(1) චතුරාර්ය සත්‍යය මඟින් ය. (2) පුනර්භවය මඟින් ය.
(3) පරාභව සූත්‍රය මඟින් ය. (4) හේතුඵල දහම මඟින් ය.

18. බුදුන් වහන්සේ විසින් දිවා රාත්‍රී පින් වැඩෙන කටයුතු ලෙස දක්වා ඇත්තේ,
(1) ළිං පොකුණු තැනීම. (2) මංමාවත් ඉදිකිරීම.
(3) ඒ දඬු පාලම් තැනීම. (4) ඉහත සියල්ලම.

19. කායික හා මානසික නිරෝගී භාවය පිණිස වඩාත් හේතු වන පංචශීලයෙහි ඇතුළත් ශික්ෂාවන් වන්නේ,
(1) දෙවන හා තෙවන ශික්ෂාවන් (2) තෙවන හා සිව්වන ශික්ෂාවන්
(3) පළමු හා පස්වන ශික්ෂාවන් (4) තෙවන හා පස්වන ශික්ෂාවන්

20. සංඛ්‍යාත්මකව අංකයෙන් අංකයට වැඩිවන සේ ධර්ම කරුණු දැක්වෙන සූත්‍ර එකතුව හැඳින්වෙන්නේ,
(1) දීඝනිකාය නමින් (2) අංගුත්තර නිකාය නමින්
(3) සංයුක්ත නිකාය නමින් (4) මජ්ඣිම නිකාය නමින්

21. හොඳින් කා බී ජීවත්වීම පමණක් මිනිසාගේ දියුණුව යැයි සිතන්නවුන් බුදු දහමෙහි සමකොට ඇත්තේ,
(1) කaaර කොටියන්ට (2) කපටි නරියන්ට
(3) එඩිතර සිංහයන්ට (4) සූර කපුටන්ට

22. "සමජීවිකතාව" යන්නෙන් අර්ථවත් වන්නේ,
(1) සමගියෙන් ජීවත් වීමයි. (2) ආදායමට වඩා වියදම් කිරීමයි.
(3) අයවැය මනාව තුලනය කර ගැනීමයි. (4) ඉහළ ආදායම් ලැබීමයි.

23. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් හැඳින්වීම සඳහා යොදා නොගන්නා විශේෂණ පදය වන්නේ,
(1) පුබ්බාචරිය (2) පුබ්බදේව (3) බ්‍රහ්ම (4) පුත්තදාර

24. සමාධි ශික්ෂාවට පමණක් අයත් මාර්ගාංග වන්නේ,
(1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා (2) සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා සති
(3) සම්මා සති, සම්මා කම්මන්ත, සම්මා ආජීව (4) සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි

25. ඉන්ද්‍රිය හා එයට අරමුණු වන කරුණු හා නොගැළපෙන පිළිතුර තෝරන්න.
(1) ඇස - ශබ්දය (2) නාසය - ගන්ධ (3) දිව - රස (4) කය - ස්පර්ශය

26. කුසල ක්‍රියාවන් කිරීමේ දී මුල් වන චේතනා තුන නම්,
(1) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ (2) ලෝභ, දෝස, මෝහ
(3) අලෝභ, අදෝස, අමෝහ (4) අලෝභ, දෝස, මෝහ

27. දුප්පතුන්ට ධනය නූපදින කල්හි දිළිඳුකම වැඩිවිය. දිළිඳුකම වැඩිවීම නිසා,
(1) අවි ආයුධ ඇති විය. (2) බොරු කීම, කේලම් කීම ඇතිවිය.
(3) සොරකම වැඩි විය. (4) ප්‍රාණඝාතය සිදුවිය.

28. "ප්‍රතිසන්ධි සිත හේතු කොටගෙන පංචස්කන්ධය ඇතිවේ" යන්න සඳහන් අනුලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,
(1) අවිජ්ජා පච්චයා සංඛාරා යන්නයි. (2) සංඛාර පච්චයා විඤ්ඤාණං යන්නයි.
(3) විඤ්ඤාණ පච්චයා නාමරූපං යන්නයි. (4) නාමරූප පච්චයා සලායතනං යන්නයි.

29. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූයේ,
(1) ලාභ අපේක්ෂාවෙන් දුසිල් මහණුන් සසුන්ගත වීමයි.
(2) වජ්ජීපුත්තක භික්ෂූන්ගේ දස අකැප වස්තුවයි.
(3) සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු වචනයයි.
(4) ධර්මය විනාශ වීමේ අවධානමක් ඇතිවීමයි.

30. "මා විසින් යම් ධර්මයක් දේශනා කරන ලද නම්, විනයක් පනවන ලද නම් ඒ ධර්මය හා විනය මාගේ ඇවෑමෙන් ශාස්තෘවරයා වන්නේ" යැයි බුදුරජාණන් වහන්සේ විසින් වදාළේ,
(1) අනුරුද්ධ තෙරුන්ට ය. (2) උපාලි තෙරුන්ට ය.
(3) ආනන්ද තෙරුන්ට ය. (4) මහා කාශ්‍යප තෙරුන්ට ය.

31. අපරන්ත දේශයට බුදු දහම ගෙන ගිය යෝනක ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ ධර්ම දේශනා කළ බව සඳහන් වන්නේ,
(1) දේවදූත සූත්‍රයෙන් ය. (2) ආසිවිසෝපම සූත්‍රයෙන් ය.
(3) අග්ගික්ඛන්ධෝපම සූත්‍රයෙන් ය. (4) කාලකාරාම සූත්‍රයෙන් ය.

32. ලක්දිව බුදුදහම ප්‍රතිෂ්ඨාපනයෙහිලා මූලික වූ පළමු කුල කුමරු වූයේ,
(1) සද්ධාතිස්ස කුමරු (2) කාවන්තිස්ස කුමරු
(3) මහා අරිට්ඨ කුමරු (4) පණ්ඩුකාභය කුමරු

33. අනුරාධපුර සමාධි බුද්ධ ප්‍රතිමාවේ දක්නට ලැබෙන මුද්‍රාව වන්නේ,
(1) ධ්‍යාන මුද්‍රාව. (2) අභය මුද්‍රාව. (3) විතර්ක මුද්‍රාව (4) ධර්මචක්‍ර මුද්‍රාව

34. බෝධීන් වහන්සේ වටා නිමවන ලද පටු පියස්සක් සහිත මණ්ඩපය,
(1) බෝධිඝරය නම් වේ. (2) චේතියඝරය නම් වේ.
(3) වාහල්කඩ නම් වේ. (4) කොරවක්ගල නම් වේ.

35. මහනුවර යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
(1) හිඳගල විහාරයයි. (2) ගල් විහාරයයි. (3) තිවංක පිළිමගෙය (4) මැදවල විහාරය

36. ලක්දිව බුදු දහම ස්ථාපිත වීමෙන් පසු දේවානම්පියතිස්ස රජතුමා විසින් ඉදිකරන ලද ථූපාරාම දාගැබෙහි තැන්පත් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ,
(1) ග්‍රීවා ධාතුව (2) දකුණු අකු ධාතුව (3) ලළාට ධාතුව (4) වම් අකු ධාතුව

37. A - කාව්‍යොශ්බරය B - පඤ්චිකා ප්‍රදීපය C - බුද්ධිප්‍රාසාදිනිය
D - මුනිගුණාලංකාරය E - පරවි සංදේශය
යන කෘති අතර තොටගමුවේ ශ්‍රී රාහුල හිමි රචනා කළ කෘති වන්නේ,
(1) A B C D (2) A B C E (3) A B D E (4) B C D E

38. රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුවපහසුව යනාදිය කැපකිරීම රජු සතු,
(1) පරිත්‍යාගය යි. (2) දානය යි. (3) නිහතමානී බවයි. (4) සෘජු බවයි.

39. රටෙහි ආර්ථික දියුණුව සඳහා රජයට බදු ගෙවීම් ආදී යුතුකම් ඉටු කළ යුතුය. එය පංච බලි තුළ විස්තර වන්නේ,
(1) දේවතා බලි නමිනි. (2) ඥාති බලි නමිනි. (3) අතිථී බලි නමිනි. (4) රාජ බලි නමිනි.

40. තමන් කරන ක්‍රියාවන්හි විපාක තමන් කරා පැමිණෙන බව දැකීම දහමෙහි හැඳින්වෙන්නේ,
(1) ධ්‍යාන සම්මා දිට්ඨි (2) කම්මස්සකතා සම්මා දිට්ඨි
(3) විදර්ශනා සම්මා දිට්ඨි (4) ඵල සම්මා දිට්ඨි

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය தரம் Grade 11 ශ්‍රේණිය	බුද්ධ ධර්මය - II	කාලය நேரம் Time

නම பெயர் Name .....

විභාග අංකය சுட்டிலக்கம் Index No. .....

- පළමු ප්‍රශ්නය ඇතුලු ව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

---

1) i. සිදුහත් බෝසතාණන් වහන්සේගේ දුෂ්කර ක්‍රියා කළ කාලය කොපමණද?

ii. "සමග්ගා හෝථ මා විවදථ" යන පාඨයෙහි අදහස ලියන්න.

iii. බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන ජාතක කතා දෙකක් නම් කරන්න.

iv. විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

v. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥා ශික්ෂාවට අයත් අංග දෙක මොනවාද?

vi. පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු දෙකක් ලියන්න.

vii. බුදු දහමේ සිතීමේ හා විමසීමේ නිදහස අගය කරමින් දේශනා කළ සූත්‍රය කුමක් ද?
එය දේශනා කළේ කා හට ද?

viii. බුදුන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව පස්වන හා අටවන වස් කාලයන් ගත කළ ස්ථාන දෙක ලියා දක්වන්න.

ix. "ආරෝග්‍ය පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං" ගාථා පාඨයේ අදහස ලියන්න.

x. කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන හා කැලණියේ පැලියගොඩ විද්‍යාලංකාර පිරවෙන ආරම්භ කිරීමට මූලිකත්වය ගත් යතිවරයන් වහන්සේලා දෙනම නම් කරන්න.

(ල. 2x10=20)

2) i. බුදුන් වහන්සේට මුහුණ පෑමට සිදු වූ අභියෝග දෙකක් ලියන්න. (ල. 02)

ii. ඉන් එක් අවස්ථාවකට උන්වහන්සේ මුහුණදුන් අයුරු පැහැදිලි කරන්න. (ල. 02)

iii. බුදු සිරිත ඇසුරින් ජීවිත අභියෝග ජයගත හැකි ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ල. 05)

3) i. "අසවලා මට බැන්නේය. මට පහර දුන්නේ ය. මා පැරදවූයේ ය. මා සතු දේ පැහැර ගත්තේ ය. යනුවෙන් යම් අය නැවත නැවතත් සිතමින් වෛර බඳින් නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ."
මේ අදහස ඇති ධම්ම පද ගාථාව ලියන්න. (ල. 02)

ii. ධම්මපදයේ ගාථා ගණන, වග්ග ගණන හා එය අයත්වන නිකාය නම් කරන්න. (ල. 03)

iii. පුද්ගල, කාල, දේශ භේදයකින් තොරව සමාජ යහපත උදෙසා වටිනා උපදෙස් ලබාගත හැකි කෘතියක් ලෙස ධම්මපදය අගයන්න. (ල. 05)

PAST PAPERS WIKI

4) i. බුදු දහමේ මූලික ඉගැන්වීම් දෙකක් ලියන්න. (ල. 02)

ii. චුල්ල කම්ම විභංග සූත්‍රයට අනුව පහත ප්‍රතිඵල ලැබීමට හේතුවන්නේ කුමන ක්‍රියාවක් දැයි ලියා දක්වන්න.

- දීර්ඝායුෂ ලැබීම.
- නිරෝගීව ඉපදීම.
- මහාභෝගීව ඉපදීම. (ල. 03)

iii. සමාජ ගැටලු විසඳාගැනීම සඳහා පටිච්චසමුප්පාද න්‍යාය උපයෝගී කොට ගත හැකි අයුරු පහදන්න. (ල. 05)

5) i. මහින්දාගමනයට පෙර ලක්දිව පැවති ඇදහිලි විශ්වාස දෙකක් නම් කරන්න. (ල. 02)

ii. මහින්දාගමනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 03)

iii. ආගමික සහජීවනය ගොඩනැගීම උදෙසා බෞද්ධ සහජීවන සංකල්ප ඉවහල්වන ආකාරය නිදසුන් මගින් විස්තර කරන්න. (ල. 05)

6) i. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති දෙකක් නම් කරන්න. (ල. 02)

ii. ඉහත (i) හි දැක්වූ එක් ප්‍රතිපත්තියක් විස්තර කරන්න. (ල. 03)

iii. පරමාදර්ශී පාලන තන්ත්‍රයක් උදෙසා බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තිවල ඇති වැදගත්කම ඇගයීමට ලක් කරන්න. (ල. 05)

7) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි.

ii. මුරගල

iii. කණිෂ්ක ධර්ම සංගායනාව

iv. සිව්බඹ විහරණ

(ල. 5x2=10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank